GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/07/04

**මාධ්‍ය නිවේදනයයි**

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ 95% පමණ ඉක්ම වූ වෛද්‍යවරුන්ගේ ජන්දයෙන් අති විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබූ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා ඇතුලු කණ්ඩායම, තනතුරු වල ක්‍රියාත්මකවීම වලක්වා ඇති බව පුවත්පත් වල පලවී ඇත. මේ සම්බන්ධව නීත්‍යානුකූලව ගත යුතු පියවර ගෙන තත්ත්වය ස්ථාවර කිරීමට දැනට කටයුතු කරගෙන යනු ලැබේ. වෛද්‍ය පාදෙනිය ඇතුලු කණ්ඩායම පත් වී වසර 03 ක් තිස්සේ කිසිදු දීප්ත ව්‍යාජත වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකින් තොරව, වෛද්‍යවරුන්ගේ වැටුප් ඇතුලු ගැටළු සහගත කරුණු රාශියක් විසඳීම සඳහා දායක වී ඇත. එපමණක් නොව, පොදුවේ මහ ජනතාවට බලපාන කරුණු සම්බන්ධයෙන් නිර්භයව මහජන සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කර ඇත. විශේෂයෙන් කිරි පිටි පිළිබඳ ගැටලුවේදීත්, දූෂිත ඖෂධ සමාගම් වලට එරෙහිවත් පමණක් නොව කෘෂි රසායන වලින් මහජනතාව බේරා ගැනීමටත් තිරණාත්මක කාර්‍යභාරයක් අප විසින් ඉටු කරන ලදි. මාෆියා ලෙස පොදුවේ හඳුන්වන මෙම කණ්ඩායම් යම් කිසි වෛද්‍යවරුන් පිරිසක් අපට විරුද්ධව උසි ගන්වනු ඇති බවට අප බලාපොරොත්තු වූයෙමු.

මෙම සමාගම් උපයෝගී කරගෙන ඇති මෙම වෛද්‍ය කණ්ඩායම් වෛද්‍ය පාදෙනිය මහතා ඇතුලු කාණ්ඩායම සංගමයෙන් ඉවත් කිරීමට අසාර්ථක උත්සහයන් හී යෙදෙන බව පෙනෙන්නට ඇත. ඉතා ප්‍රජාතන්ත්‍රවාදිව කටයුතු කරන සංගමයක් ලෙස ස්වාධින නිලවරණ කමිටුවකින් පැවැත්වීමට ගිය ජන්දයට දිගින් දිගටම බාධා කරන ලදි. මෙම අතලොස්ස ගරු අධිකරණය පවා නොමග යවමින් කටයුතු කල නමුත්, අප සංගමය අධිකරණ තීන්දු වලට හිස නමමින් නිලවරණය පවත්වන ලදි.

බුද්ධිමත්, දේශයට ලැදි වෛද්‍යවරුන් බහුතරයකින් සමන්විත අප සංගමයේ වෛද්‍යවරු වෛද්‍ය පාදෙනිය මහතා ඇතුලු පිරිසිට අතිවිශිෂ්ඨ ජයක් හිමි කර දෙන ලදි. විවිධ දේශපාලන පක්ෂ වල කමිටුවල සමාජිකත්වය දරණ සහ විවිධ සංගම් වලින් වරප්‍රසාද ලබන සියයක් පමණ වු වෛද්‍යවරු අතලොස්සක් අපට එරෙහිව ඇත. නමුත් එය 5% වැනි ඉතා කුඩා ප්‍රමාණයක් බව තේරුම් ගත යුතුව ඇත. මේ කඩාකප්පල්කාරී කටුයතු සඳහා මූලිකව කටයුතු කරන වෛද්‍යවරු හත් දෙනා විවිධ දේශපාලන පක්ෂ සමග සම්බන්ධකම් පවත්වති. විවිධ සමාගම් වල අනුග්‍රහයෙන් විදේශ සංචාර ඇතුලු වරප්‍රසාද ලැබීම අරඹා ඇත. නමුත් සමාගම් වියදම් කල මුදලින් අපේකෂා කල ප්‍රතිපල ලබා දීමට නොහැකි වු තැන කැපුනු පණුවන් මෙන් හැසිරෙනු දක්නට ලැබේ. මෙම පිරිස වෛද්‍යවරුන්ගේ නාමයට කැලලකි.

මෙවන් තත්ත්වයන් පරිනත මාධ්‍යවේදින්ට අලුත් දේවල් නොවේ. කෙසේ නමුත් අප සංගමය නියෝජනය කරන නීතිඥ මහතුන් මේ කාරණය නිරාකරණය කර දීමට කටයුතු කරන්නේ දැඩි ආත්ම විශ්වාසයකිනි. කවදත් ජනප්‍රිය මාතෘකාවට වඩා නිවැරදි විද්වත් තිරණ වෙනුවෙන් පෙනීසිටින රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයට මෙම තත්ත්වය පහසුවෙන් මුහුන දිය හැකි අභියෝගයක් ලෙස අපි පෙන්වා දෙමු. සමාගම් වෙනුවෙන් රටේ අභිවෘද්ධිය පාවා දෙන්නන් බිහිවීම කවර සමාජයකටවත් මුලිනුපුටා දැමීමට නොහැකි බව ඔබ කවුරුත් දන්නා කරුනකි.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

| | | | |
|---|---|---|---|
| **වැඩිදුර විස්තර සඳහා :** | වෛද්‍ය නවින් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |
| | වෛද්‍ය සමන්ත ආනන්ද | - | 0777666301 |
| | වෛද්‍ය හරිත අළුත්ගේ | - | 0718121619 |